සියලු ම හිමිකම් ඇවිරිණි

aat SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අවසාන විභාගය - 2011 ජූලි

## (60) උසස් මූල්‍ය ගිණුම්කරණය

Advanced Financial Accounting

2011-07-17
පෙරවරු
[9.00 – 12.00]

**කාලය: පැය 03 යි.**

පිටු ගණන: 09
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්:**
  - *(1) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු ය.***
  - *(2) **පෙරවැඩ** සියල්ල ඉදිරිපත් කරන්න. ඔබ විසින් කරනු ලබන **උපකල්පන** කිසිවක් වේ නම්, ඒවා පැහැදිලිව සඳහන් කරන්න.*
  - *(3) ඉල්ලුම් කරන ලද **මාධ්‍යයට** අදාලව, **එක් භාෂාවකින්** පමණක්, ඔබ වෙත සපයනු ලබන **පොත්වල** උත්තර ලියන්න.*
  - *(4) **ගණක යන්ත්‍ර** භාවිත කිරීමට **ඉඩ දෙනු ලැබේ**.*
  - *(5) ලකුණු 100.*

---

**01.** (A) සීමාසහිත පොදු සමාගමක් වන **පැරගන්** හි 2011 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත සඳහන් පරිදි විය.

**2011 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම**

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| <u>ප්‍රකාශ කළ ප්‍රාග්ධනය</u><br>සාමාන්‍ය කොටස් (කොටස් 1,000,000) | | 22,000 |
| වරණීය කොටස් (කොටස් 512,500) | | 8,200 |
| 15% ණයකර | | 3,000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 2,500 |
| පොදු සංචිතය | | 3,400 |
| 2010 අප්‍රේල් 01 දිනට රඳවා ගත් ඉපැයීම් | | 4,800 |
| <u>දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට</u> | | |
| ඉඩම | 17,000 | |
| ගොඩනැගිල්ල | 10,080 | |
| මෝටර් වාහන | 3,500 | |
| කාර්යාල උපකරණ | 3,200 | |
| ලී බඩු හා සවිකිරීම් | 1,200 | |
| <u>2010 අප්‍රේල් 01 දිනට ක්ෂය ප්‍රතිපාදනය</u> | | |
| ගොඩනැගිල්ල | | 5,040 |
| මෝටර් වාහන | | 1,400 |
| කාර්යාල උපකරණ | | 1,760 |
| ලී බඩු හා සවිකිරීම් | | 540 |
| ආයෝජන, පිරිවැයට | 12,000 | |
| තොග | 10,600 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 8,700 | 7,469 |
| උපචිත වියදම් | | 1,245 |
| බැංකු ණය | | 6,500 |
| ගෙවූ ලාභාංශ | 1,000 | |
| මුදල් හා බැංකු ශේෂ | 3,890 | |
| 2010 අප්‍රේල් 01 දිනට අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය | | 196 |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 62,400 | 96,000 |
| ආයෝජන ආදායම් | | 960 |
| පරිපාලන වියදම් | 12,760 | |
| විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් | 10,760 | |
| වෙනත් මෙහෙයුම් වියදම් | 6,000 | |
| මූල්‍ය වියදම් | 1,300 | |
| ගෙවූ බදු | 620 | |
| | **165,010** | **165,010** |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත:

(1) 2011 මාර්තු 15 දින දැනට සිටින සියළුම සාමාන්‍ය කොටස් හිමියන්ට හිමිකම් නිකුතුවක් (right issue) කළ අතර ඒ අනුව දැනට දරණ සෑම කොටස් 8 කටම එක් කොටසක් ලැබෙන සේ කොටසක් රු.15/- බැගින් නිකුත් කරන ලදී. කෙසේ වුවද ලැබුන මුදල් බැංකු ගිණුමට හර කර වෙළෙඳ ලැබිය යුතු මුදල් ගිණුමට බැර කිරීම හැර මෙම ගනුදෙනුව සුදුසු පරිදි ලෙජරයේ සටහන් කර නැත. සියළුම කොටස් හිමියන් තමන්ට හිමි හිමිකම ක්‍රියාත්මක කළ (exercised) බව උපකල්පනය කරන්න.

(2) නාමික අගය රු.2,000,000/- ක් වූ 15% ණයකර 12% අධිමිලක් ඇතිව 2010 දෙසැම්බර් 31 දින නිදහස් කරන ලදී. මේ සඳහා අවශ්‍ය මුදල් සපයා ගැනීම සඳහා සමාගම එහි ආයෝජන වලින් කොටසක් ඒවායේ පිරිවැයට විකුණන ලදී. ආයෝජන විකිණීමෙන් ලැබුන මුදල ලෙජරයේ හා බැංකු ගිණුමේ නිවැරදිව සටහන් කරන ලදී. කෙසේ වුවද ණයකර නිදහස් කිරීම සඳහා ගෙවූ මුදල වෙළෙඳ ගෙවිය යුතු මුදල් ගිණුමේ සහ බැංකු ගිණුමේ සටහන් කර ඇත.

(3) සමාගම රු.1,200,000/- කට මිලට ගෙන තිබුණ වාහනයක් එය අනතුරකට පත්වූ බැවින් 2011 පෙබරවාරි 28 දින බැහැර කරන ලදී. විකුණුම් මිල රු.250,000/- ක් වූ අතර 2010 අප්‍රේල් 01 දිනට මෙම වාහනයේ සමුච්චිත ක්ෂය ප්‍රමාණය රු.240,000/- ක් විය. රක්ෂණ සමාගම ඒ සඳහා රු.400,000/- ක වන්දි මුදලක් ගෙවීමට එකඟ වී ඇත. රක්ෂණ වන්දි මුදල මේ දක්වා ලැබී නැත. වාහනය විකුණා ලැබූ මුදල බැංකු ගිණුමට හර කර මෝටර් වාහන ගිණුමට බැර කිරීම හැර වාහනය බැහැර කිරීම සම්බන්ධයෙන් වෙනත් සටහන් කිසිවක් තබා නැත.

(4) සමාගම 2011 ජනවාරි 31 දින රු.375,000/- ක පිරිවැයකට අළුත් පරිගණක 3 ක් මිළදී ගන්නා ලදී.

(5) සමාගමේ දේපල, පිරියත හා උපකරණ ක්ෂය කරන අනුපාතික (සරල මාර්ග ක්‍රමයට) පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ල | - | වර්ෂයකට 5% බැගින් |
| මෝටර් වාහන | - | වර්ෂයකට 20% බැගින් |
| කාර්යාල උපකරණ | - | වර්ෂයකට 20% බැගින් |
| ලී බඩු සහ සවිකිරීම් | - | වර්ෂයකට 15% බැගින් |

(6) ණයගැතියෙකුගෙන් ලැබී තිබුන රු.23,000/- ක් වටිනා චෙක්පතක් 2011 මාර්තු මස අගදී බැංකුව විසින් ආපසු එවා තිබුණි. කෙසේ වුවද මෙය පිළිබිඹු කිරීම සඳහා ලෙජර් ගිණුම් ගලපා නැත.

(7) වර්ෂය තුලදී ණයගැතියෙකුගෙන් අයවීමට තිබූ රු.65,000/- ක් බොල් ණයක් ලෙස හඳුනාගෙන ඇත. ශේෂපත්‍ර දින ඇති වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් 3% ක් වනසේ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය කිරීමට සමාගම තීරණය කරන ලදී.

(8) ශේෂ පිරික්සුම උපුටා ගන්නා ලද අවස්ථාව වනවිට පහත සඳහන් වියදම් ගිණුම්ගත කොට නොතිබුණි.

| | | රු. |
|---|---|---|
| විගණන ගාස්තු | - | 150,000/- |
| දුරකතන, ජලය හා විදුලිය | - | 12,000/- |
| විකුණුම් දිරි දීමනා | - | 22,000/- |

(9) 2011 මාර්තු 31 දිනට සමාගම පහත සඳහන් කලින් ගෙවීම් සිදුකර තිබුණි.

| | රු. |
|---|---|
| කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණ | 800,000/- |
| කාර්යාල උපකරණ නඩත්තුව | 18,000/- |

(10) බැංකු ණය මුදලින් $\frac{1}{5}$ ක් 2011/12 වර්ෂය තුළදී නිරවුල් කළ යුතුය.

(11) වර්ෂය සඳහා ආයෝජන ආදායම රු.1,100,000/- කි.

(12) සියලුම ආයෝජන දිගුකාලීන ආයෝජන වේ.

(13) 2010/11 තක්සේරු වර්ෂය සඳහා සමාගමේ ආදායම් බදු වගකීම රු.752,000/- ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(14) 2011 මැයි 01 දින පවත්වන ලද රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් දෑ නිර්දේශ කරන ලදී:

- රු.1,000,000/- ක් පොදු සංචිතයට මාරු කිරීම.
- 2011 මාර්තු 31 දිනට දැරූ සාමාන්‍ය කොටස් සඳහා කොටසකට රු.2/- බැගින් වූ සාමාන්‍ය අවසාන ලාභාංශයක් ගෙවීමට.
- 2011 මාර්තු 31 දිනට දැරූ වරණීය කොටස් සඳහා කොටසකට රු.1.20 බැගින් වූ ලාභාංශයක් ගෙවීමට.

ඉහත සඳහන් තොරතුරු සැලකිල්ලට ගනිමින් **ඔබ විසින්, සීමාසහිත පැරගන් පොදු සමාගම** සඳහා ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන් **පහත දෑ පිළියෙල කළ යුතුය**:

(a) 2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය. (ලකුණු 10)

(b) 2011 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය. (ලකුණු 09)

(c) දේපල, පිරියත හා උපකරණ වලට සටහන්. (ලකුණු 05)

(d) 2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දක්වන ප්‍රකාශය. (ලකුණු 03)

(B) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි *("Accounting Policies, Changes in Accounting Estimates and Errors")* දී ඇති නිර්වචන වලට අනුව පහත සඳහන් පද (terms) පැහැදිලි කරන්න.

(a) ගිණුම්කරණ ප්‍රතිපත්ති (Accounting Policies).

(b) ප්‍රමාණාත්මක (Material).

(c) පූර්ව කාලපරිච්ඡේද වැරදි (Prior Period Errors). (ලකුණු 03)

(මුළු ලකුණු 30)

**02.** (A) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ ජීවිත රක්ෂණ ඔප්පු සඳහා ගිණුම් තැබීමට ඇති ක්‍රම තුන(03) දක්වන්න. (ලකුණු 03)

(B) **අනිල්** සහ **සුනිල්** හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෝ වෙති. පහත සඳහන් ශේෂ පිරික්සුම 2011 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලදි.

**අනිල් සහ සුනිල් හවුල් ව්‍යාපාරය**
**2011 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම**

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| උපචිත වියදම් | | 140 |
| ජංගම ගිණුම් - **අනිල්** | | 400 |
| - **සුනිල්** | | 350 |
| ප්‍රාග්ධන ගිණුම් - **අනිල්** | | 1,000 |
| - **සුනිල්** | | 850 |
| ඉඩම් සහ ගොඩනැගිලි, පිරිවැයට | 1,000 | |
| පිරියත හා යන්ත්‍රෝපකරණ, පිරිවැයට | 900 | |
| මෝටර් කාරය, පිරිවැයට | 850 | |
| කාර්යාල උපකරණ, පිරිවැයට | 450 | |
| සමුච්චිත ක්ෂය: ඉඩම් සහ ගොඩනැගිලි | | 100 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | | 180 |
| මෝටර් කාරය | | 170 |
| කාර්යාල උපකරණ | | 90 |
| ශුද්ධ ලාභය (2011 මාර්තු 31දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා) | | 800 |
| කලින් ගෙවීම් | 240 | |
| අනිල්ට ගෙවූ වැටුප් | 240 | |
| තොග | 360 | |
| අත ඉතිරි මුදල් | 480 | |
| බැංකු අයිරාව | | 300 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 260 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 120 | |
| | **4,640** | **4,640** |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

(1) හවුල් ගිවිසුමේ සහත සඳහන් විධිවිධාන ඇතුළත් විය:

(i) හවුල් ව්‍යාපාරයේ ලාභ හා අලාභ සමසේ බෙදා ගැනීම.

(ii) **අනිල්ට,** මසකට රු.20,000/- බැගින් වූ වැටුපක් හිමිය.

(iii) ප්‍රාග්ධන පොලිය, ප්‍රාග්ධන ගිණුම අවසානයේ පැවති ශේෂය මත 10% බැගින්, ගණනය කිරීම.

(2) 2011 අප්‍රේල් 01 දින මෙම හවුල් ව්‍යාපාරය සීමාසහිත වගකීම් සහිත සමාගමක් බවට පරිවර්තනය කිරීමට හවුල්කරුවන් තීරණය කළහ. මෙම පරමාර්ථයෙන් **සීමාසහිත A ඇන්ඩ් S** නමින් **සමාගමක්** සංස්ථාපනය කරන ලදී.

(3) **අනිල්** විසින් මෝටර් රථය රු.500,000/- ක එකඟ වූ අගයකට පවරා ගන්නා ලදී.

(4) හවුල් ව්‍යාපාරයේ අත ඉතිරි මුදල් හැර අනෙකුත් වත්කම් හා වගකීම් **A ඇන්ඩ් S සමාගම** විසින් රුපියල් මිලියන 2.3 ක ගැනුම් ප්‍රතිප්ඨාවකට පවරා ගන්නා ලද අතර එකක් රු.20/- බැගින් වූ සාමාන්‍ය කොටස් 100,000 ක් නිකුත් කිරීමෙන් සහ ඉතිරිය මුදලින් ගෙවීමෙන් 2011 අප්‍රේල් 01 වන දින ගැනුම් ප්‍රතිප්ඨාව පියවන ලදී. **A ඇන්ඩ් S සමාගම** හවුල් ව්‍යාපාරයෙන් අත්පත් කරගත් මුදල් ගෙවීම් සඳහා බැංකු ගිණුම පාවිච්චි කරන ලදී.

(5) ඔවුන්ගේ හවුල් ව්‍යාපාර ගිණුම්වල යම් හිඟයක් අතිවුවහොත් ඒ සඳහා මුදල් ගෙන ඒමට හවුල්කරුවන් එකඟ වී ඇත.

**ඉහත සඳහන් තොරතුරු පදනම් කරගෙන, ඔබ විසින් පිළියෙල කළ යුතු දෑ:**

(a) 2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විසර්ජන ගිණුම.

(b) හවුල්කරුවන්ගේ ගිණුම් (ජංගම සහ ප්‍රාග්ධන ගිණුම්).

(c) උපලබ්ධි ගිණුම.

(d) 2011 අප්‍රේල් 01 දිනට **A ඇන්ඩ් S සමාගමේ ආරම්භක** ශේෂ පත්‍රය. (ලකුණු 12)

(මුළු ලකුණු 15)

03. (A) **සීමාසහිත හිරුණි සමාගමේ** සහ **සීමාසහිත වරුණි සමාගමෙහි** 2011 මාර්තු 31 දිනට ශේෂ පත්‍ර පහත දී ඇත.

**2011 මාර්තු 31 දිනට ශේෂ පත්‍ර** *(රු.'000)*

| | **සීමාසහිත හිරුණි සමාගම** | **සීමාසහිත වරුණි සමාගම** |
|---|---|---|
| **වත්කම්**<br>**ජංගම නොවන වත්කම්**<br>(ධාරණ අගයට) | | |
| දේපළ, පිරියත හා උපකරණ | 56,000 | 46,500 |
| **ආයෝජන**<br>**සීමාසහිත වරුණි සමාගමේ** සාමාන්‍ය කොටස් | 33,000 | - |
| **ජංගම වත්කම්** | | |
| තොග | 6,800 | 4,300 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 7,400 | 6,500 |
| ලැබිය යුතු විනිමය බිල් | 1,120 | 950 |
| මුදල් හා බැංකු ශේෂ | 2,700 | 752 |
| **මුළු වත්කම්** | **107,020** | **59,002** |
| **ස්කන්ධය හා වගකීම්**<br>**ස්කන්ධය** | | |
| ප්‍රකාශ කළ ප්‍රාග්ධනය | - | - |
| සාමාන්‍ය කොටස් | 45,000 | 36,000 |
| වරණීය කොටස් | 13,000 | 10,000 |
| **සංචිත** | | |
| පොදු සංචිතය | 24,500 | 4,310 |
| රඳවාගත් ඉපැයීම් | 5,560 | 2,950 |
| **ජංගම නොවන වගකීම්** | | |
| බැංකු ණය | 6,000 | - |
| **ජංගම වගකීම්** | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 8,250 | 3,500 |
| ගෙවිය යුතු විනිමය බිල්පත් | 2,450 | 1,500 |
| උපචිත වියදම් | 1,385 | 477 |
| ගෙවිය යුතු ආදායම් බදු | 875 | 265 |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | **107,020** | **59,002** |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

(1) **සීමාසහිත හිරුණි සමාගම, සීමාසහිත වරුණි සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් 2008 අප්‍රේල් 01 දින අත්පත් කර ගන්නා ලදි.

(2) අත්පත් කරගත් දින පහත සඳහන් ශේෂයන් **සීමාසහිත වරුණි සමාගමේ** පොත්වල පෙන්නුම් කෙරිණි.

| | <u>රු.</u> |
|---|---|
| පොදු සංචිතය | 2,560,000/- |
| රඳවා ගත් ඉපැයීම් | 1,800,000/- |

(3) **සීමාසහිත හිරුණි සමාගම** පිරිවැයෙන් 30% ක ලාභයක් සහිතව **සීමාසහිත වරුණි සමාගමට** භාණ්ඩ විකුණන ලදී. 2011 මාර්තු 31 දිනට **සීමාසහිත වරුණි සමාගමේ** අවසාන තොගවල **සීමාසහිත හිරුණි සමාගමෙන්** මිලදී ගත් රු.195,000/- වටිනාකම ඇති භාණ්ඩ ඇතුලත්ය.

(4) **සීමාසහිත හිරුණි සමාගමේ** ලැබිය යුතු බිල්පත් ගිණුමේ **සීමාසහිත වරුණි සමාගමෙන්** ලැබිය යුතු රු.850,000/- වටිනා බිල්පතක් අඩංගු වේ.

(5) **සීමාසහිත හිරුණි සමාගම** 2010 අප්‍රේල් 01 දින රුපියල් මිලියන 2.55 ක් පිරිවැය වූ ඉඩමක් රුපියල් මිලියන 2.7 කට **සීමාසහිත වරුණි සමාගමට** විකුණන ලදී.

**ඉහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන, ඔබ විසින්,** 2011 මාර්තු 31 දිනට ඒකාබද්ධ ශේෂ පත්‍රය පිළියෙල කළ යුතුවේ. (ලකුණු 13)

(B) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 26 (ඒකාබද්ධ හා වෙන් වූ මූල්‍ය ප්‍රකාශ - Consolidated and Separate Financial Statements) දී ඇති නිර්වචන අනුව පහත සඳහන් පද පැහැදිලි කරන්න.

(a) පිරිවැය ක්‍රමය (cost method).

(b) වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශ (Separate Financial Statements). (ලකුණු 04)

(මුළු ලකුණු 17)

**04.** (A) රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ (Committee On Public Accounts) කාර්යභාරය හා බලතල ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)

(B) රජයේ මුදල් රෙගුලාසි වල පරමාර්ථය කෙටියෙන් විස්තර කර එම රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාකළ යුතුවන ක්ෂෙත්‍ර සඳහා උදාහරණ තුනක්(03) දක්වන්න. (ලකුණු 03)

(C) අයවැය පිළියෙල කිරීම, ආදායම් හා වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ ක්‍රියාවලිය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

**05.** **සීමාසහිත අකිහබාරා පොදු සමාගමේ** 2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය සහ 2010 මාර්තු 31 දිනට සහ 2011 මාර්තු 31 දිනට ශේෂ පත්‍ර පහත දී ඇත.

**සීමාසහිත අකිහබාරා පොදු සමාගමේ**
**2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

| | රු.'000 | රු.'000 |
|---|---|---|
| විකුණුම් | | 107,250 |
| විකුණුම් පිරිවැය | | (77,220) |
| දළ ලාභය | | 30,030 |
| වෙනත් ආදායම් | | 1,870 |
| | | 31,900 |
| **අඩුකළා: වියදම්** | | |
| බෙදාහැරීමේ වියදම් | 5,362 | |
| පරිපාලන වියදම් | 12,500 | |
| වෙනත් වියදම් | 2,145 | |
| මූල්‍ය පිරිවැය | 4,290 | (24,297) |
| බද්දට පෙර ශුද්ධ ලාභය | | 7,603 |
| බද්ද | | (2,433) |
| **බද්දට පසු ශුද්ධ ලාභය** | | **5,170** |

**සීමාසහිත අකිහබාරා පොදු සමාගම**
**ශේෂ පත්‍ර**

| | 2011 මාර්තු 31<br>රු.'000 | 2010 මාර්තු 31<br>රු.'000 |
|---|---|---|
| **වත්කම්**<br>**ජංගම නොවන වත්කම්**<br>(ධාරණ අගයට)<br>දේපළ, පිරියත හා උපකරණ | 47,000 | 35,970 |
| ආයෝජන | 21,800 | 21,000 |
| **ජංගම වත්කම්**<br>තොග | 6,500 | 2,100 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 2,900 | 1,250 |
| මුදල් හා මුදල්වලට සමාන දෑ | 580 | 1,200 |
| **මුළු වත්කම්** | **78,780** | **61,520** |
| **ස්කන්ධය සහ වගකීම්**<br>**ස්කන්ධය**<br>ප්‍රකාශ කළ ප්‍රාග්ධනය | | |
| සාමාන්‍ය කොටස් (කොටස් 2,000,000) | 28,000 | 28,000 |
| **සංචිත** | | |
| පොදු සංචිතය | 4,650 | 4,650 |
| ලාභා'ලාභ ගිණුම | 11,420 | 6,250 |
| **ජංගම නොවන වගකීම්**<br>බැංකු ණය | 28,500 | 14,500 |
| **ජංගම වගකීම්**<br>වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 4,600 | 6,520 |
| උපචිත වියදම් | 715 | 1,250 |
| ගෙවිය යුතු ආදායම් බදු | 895 | 350 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **78,780** | **61,520** |

- සාමාන්‍ය කොටසක වෙළෙඳපොළ අගය 2011 මාර්තු 31 දිනට රු.15.50 ක් සහ 2010 මාර්තු 31 දිනට රු.16.25 ක් විය.
- විකුණුම් වලින් 85% ක් සහ ගැනුම් වලින් 65% ක් ණය පදනම මත කරන ලදී.
- 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය බදු අඩු කළ පසු ලාභය රු.6,125,000/- කි.
- 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් 30% ක් සහ 6% ක් විය.

(a) ඉහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන, **ඔබ විසින්, සීමාසහිත අකිහබාරා සමාගමේ** 2011 මාර්තු 31 දිනෙන් සහ 2010 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂ සඳහා පහත සඳහන් දෑ ගණනය කළ යුතුය.

(i) දළ ලාභ අනුපාතය. (2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පමණි)

(ii) ශුද්ධ ලාභ අනුපාතය. (2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පමණි)

(iii) ජංගම අනුපාතය.

(iv) ක්ෂණික වත්කම් අනුපාතය.

(v) තෝලන අනුපාතය.

(vi) කොටසක ඉපැයුම් අනුපාතය.

(vii) මිල ඉපැයීම් අනුපාතය.

(viii) යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ අනුපාතය. (ලකුණු 08)

(b) ගණනය කරන ලද අනුපාත භාවිත කරමින් සමාගමේ ලාභදායිත්වය (profitability) හා මූල්‍ය තත්ත්වය (financial position) සඳහන් කරමින් කළමණාකාරිත්වය වෙත වාර්තාවක් කෙටුම්පත් කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 14)

**06.** (A) **සීමාසහිත ලංකා සමාගමේ** 2011 මාර්තු 31 දිනට සහ 2010 මාර්තු 31 දිනට ශේෂ පත්‍ර සහ 2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය පහත දැක්වේ:

**සීමාසහිත ලංකා සමාගම**

**ශේෂ පත්‍ර**

| | **2011මාර්තු 31 දිනට රු.'000** | **2010 මාර්තු 31 දිනට රු.'000** |
|---|---|---|
| **<u>වත්කම්</u>** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපළ, පිරියත හා උපකරණ | 61,290 | 44,060 |
| අඩු කළා: සමුච්චිත ක්ෂය | 12,640 | 8,810 |
| | **48,650** | **35,250** |
| ආයෝජන | 3,500 | 3,500 |
| | **52,150** | **38,750** |
| **ජංගම වත්කම්** | | |
| තොග | 16,500 | 16,500 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු මුදල් | 30,000 | 25,600 |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 15,000 | 9,710 |
| | **61,500** | **51,810** |
| **මුළු වත්කම්** | **113,650** | **90,560** |
| **ස්කන්ධය හා වගකීම්** | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | |
| ප්‍රකාශ කළ ප්‍රාග්ධනය | 15,000 | 15,000 |
| ප්‍රත්‍යාගණන සංචිත | 3,000 | - |
| රඳවාගත් ඉපැයීම් | 15,310 | 13,560 |
| | **33,310** | **28,560** |
| **ජංගම නොවන වගකීම්** | | |
| පොලිය ගෙවන ණය හා ණය ගැනීම් | 35,600 | 18,600 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම | 17,000 | 15,750 |
| | **52,600** | **34,350** |
| **ජංගම වගකීම්** | | |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් | 24,740 | 25,300 |
| ආදායම් බදු වගකීම | 1,500 | 1,350 |
| ගෙවිය යුතු ලාභාංශ | 1,500 | 1,000 |
| | **27,740** | **27,650** |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | **113,650** | **90,560** |

**සීමාසහිත ලංකා සමාගමේ**
**2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

| | **රු.'000** |
|---|---|
| දළ ලාභය | 14,500 |
| අඩු කළා: වියදම් | |
| පරිපාලන වියදම් | 1,300 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 7,900 |
| පොලිය | 350 |
| බදු වලට පෙර ලාභය | 4,950 |
| ආදායම් බදු | (1,700) |
| **බද්දට පසු ලාභය** | **3,250** |
| ලාභාංශ | (1,500) |
| **රඳවාගත් ඉපැයීම්** | **1,750** |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

(1) සමාගමේ දළ ලාභ අනුපාතය 40% කි. අත්පිට හා ණයට විකුණුම් 1 : 1 පදනම යටතේ සිදුවිය.

(2) වෙනත් මෙහෙයුම් වියදම්වල විශ්‍රාම ප්‍රතිලාභ සඳහා කරන ලද රු.1,250,000/- ක ප්‍රතිපාදනයක් අඩංගු වන අතර ඒ හැරුන විට අනෙක් සියළු වියදම් මුදලින් කරන ලද ඒවා විය.

(3) සමාගම වර්ෂය තුළදී රුපියල් මිලියන 20 ක ණය මුදලක් ලබාගන්නා ලද අතර ආදායම් ප්‍රකාශයේ පෙන්වා ඇති පොලී වියදමෙන් දක්වන්නේ ඒ වෙනුවෙන් වර්ෂය තුල ගෙවා ඇති පොලියයි.

**ඔබ විසින්,** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 9 (SLAS 9) ප්‍රකාර ඍජු ක්‍රමය (direct method) භාවිත කර මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලැබුන ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කළ යුතුය. (ලකුණු 08)

(B) පහත සඳහන් කොටස් ගනුදෙනු 2010/2011 වර්ෂය තුල එක් සමාගමක් සමග කොටස් ගනුදෙනුවල නියැලුන **සීමාසහිත ඉන්පිතිටි සමාගමට** අදාල වේ.

(1) 2010 අප්‍රේල් 01 දින **සීමාසහිත ඉන්පිතිටි සමාගමට** රු.12,000/- පිරිවැය වූ වරණීය කොටස් 1,000 ක් අයත්ව තිබුණි.

(2) 2010 මැයි 30 දින එකක් රු.12.75 (ලාභාංශ සහිත) ක් බැගින් වූ වරණීය කොටස් 1,200 ක් මිලදී ගන්නා ලදී.

(3) 2010 ඔක්තෝම්බර් 01 දින එකක් රු.11.25 (ලාභාංශ රහිත) ක් බැගින් වූ වරණීය කොටස් 2,500 ක් මිලදී ගන්නා ලදී.

(4) සියළුම වරණීය කොටස් සඳහා වාර්ෂිකව සෑම වර්ෂයකටම මාර්තු 31 දිනට රු.1.50 ක ලාභාංශයක් හිමිය.

**ඔබ විසින්, සීමාසහිත ඉන්පිතිටි සමාගමේ** 2010/11 වසර සඳහා ආයෝජන ගිණුම (Investment Account) සහ කොටස් ලේඛනය (Share Register) පිළියෙල කළ යුතු වේ. (ලකුණු 06)

(මුළු ලකුණු 14)

- o0o -